# ටෙන්ඩර් දැන්වීමයි

## ඌවපරණගම ප්‍රාදේශීය සභාව

බදු කාලය -: 2026.01.01 සිට 2026.12.31

ලංසු ලේඛන නිකුත් කිරිම -: 2025.11.27දින සිට 2025.12.10 දින දක්වා කාර්යාල දින වලදි ප.ව.03.00 දක්වා ඌව පරණගම සභා කාර්යාලයේදි

ලංසුපත් භාර ගන්නා අවසාන දිනය -: 2025.12.11 පෙ.ව.10.00 දක්වා

ලංසු විවෘත කිරීම -: 2025.12.11 වන දින ලංසු පත් භාරගැනීම අවසන් වූ වහාම ඌව පරණගම ප්‍රාදේශිය සභා කාර්යාලයේදි

01. ටෙන්ඩර් ලබා ගැනීමට පැමිණීමේදී අයදුම්කරුගේ පුද්ගලික හැඳුනුම්පත/ විදෙස් ගමන් බලපත්‍රය/ රියදුරු ගමන් බලපත්‍රයන්ගෙන් එකක් ඉදිරිපත් කළ යුතුය.

02.ටෙන්ඩර්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය. ඉල්ලුම්කරුවන් ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

03.මෙම සභාවෙන් බදු දී ඇති කඩ කාමර , පොළ බදු වෙනත් ගාස්තු ආදිය සඳහා හිඟ මුදල් ගෙවීමට ඇති හෝ අසාදු ලේඛනයේ නම සඳහන් අය ගිවිසුම් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ටෙන්ඩර් ප්‍රතික්ෂේප කර ඇප මුදල සභාව සතු කරනු ලැබේ.

04.2025.12.11 දින පෙ.ව 10.00 ට පෙර ලැබෙන සේ සභාපති, ඌව පරණගම ප්‍රාදේශිය සභාව අඹගස්දෝව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් පත් එවිය යුතුය. එසේ නැතහොත් ඌවපරණගම ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට නියමිත වේලාවට හෝ ඊට පෙර බහාලිය යුතුයි. කුමන හේතුවක් නිසා හෝ නියමිත වේලාවෙන් පසු ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. එසේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් අවලංගු කර ටෙන්ඩර් තැන්පත් මුදල සභාව සතු කරගනු ලැබේ.

05.ටෙන්ඩර් පත් මුල් පිටපත සහ අනු පිටපත යනුවෙන් සඳහන් කර ටෙන්ඩර් පත් වෙන වෙනම ලිපි කවර වල බහා නැවත ලිපි කවරයක බහා එවිය යුතුයි. එසේ එවීමේදි ලිපි කවර තුනේහිම වම්පස ඉහල කෙළවරේ **“ටෙන්ටර් ස්ථානය“ පැහැදිලිවම සඳහන්** කල යුතුය.

06.අවම ලංසුවට වඩා අඩුවෙන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරන අතර ඒ සඳහා තැන්පත් කර ඇති ආපසු ගෙවන හා ආපසු නොගෙවන ඇප මුදල් සභාව සතු කරගනු ලැබේ.

07.ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගැනීමට පැමිණෙන අවස්ථාවේ පෝරම ගාස්තු සහ ටෙන්ඩර් තැන්පත් මුදල රැගෙන ආ යුතුය.

08.පොළ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී මීට පෙර අදියාරවත්ත පොළ සඳහා ඉදිරිපත් කරන ලද පිළිගත් ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කළ ඉල්ලුම්කරුවන් ටෙන්ඩර් අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

09.ටෙන්ඩර් විවෘත කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ජයග්‍රාහක ටෙන්ඩර් ඒ අවස්ථාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. ටෙන්ඩර් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ඌවපරණගම ප්‍රාදේශිය සභාවේ සභාපති සතුය. ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් වටිනාකමින් 1/3 ක මුදලක් එදිනම තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. මෙයට අමතරව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්යේ වටිනාකමට සමාන වටිනාකමින් යුත් ඇප සුරකුම්පතක් සභාව නමින් තැන්පත් කළ යුතුය. නැතහොත් චංචල හෝ නිශ්චල දේපලක් සභා සතුව සුරක්ෂිතව තැබිය යුතුය. එසේ නොමැතිනම් ටෙන්ඩරය අවලංගු කරනු ලැබේ.

CS CamScanner

ඩු දීම සඳහා තැන්පත් කර ඇති ආරක්ෂිත ඇප තැන්පත් මුදල් වර්ෂය අවසාන වන තෙක් රඳවා ගනු ලබන අතර පවත්නා වර්ෂයේ ආරක්ෂිත ඇප තැන්පත් ඉදිරි වර්ෂය සඳහා හිලව් කරනු නොලැබේ.

(උප ලේඛනය පහත පරිදි වේ)

**<u>උප ලේඛනය</u>**

| | ස්ථානය | අවම ලංසුව වාර්ෂිකව | ටෙන්ඩර් පෝරම ගාස්තු | ආපසු නොගෙවන ටෙන්ඩර්ඇප තැන්පත් | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් |
|---|---|---|---|---|---|
| 01 | අදියාරවත්ත ඉරිදා සතිපොළ | **9,66,350.00** | 200.00 | 7500.00 | 5000.00 |
| 02 | බෝඹුරුඇල්ල රථගාල | **3,85,000.00** | 200.00 | 7500.00 | 5000.00 |
| 03 | ලූණුවත්ත පොළ භූමියේ මාළු කඩ කාමර අංක 01 | 1,15,500.00 | 200.00 | 7500.00 | 5000.00 |
| 04 | ලූණුවත්ත පොළ භූමියේ මාළු කඩ කාමර අංක 02 | 1,15,500.00 | 200.00 | 7500.00 | 5000.00 |
| 05 | ලූණුවත්ත පොළ භූමියේ මාළු කඩ කාමර අංක 03 | 1,15,500.00 | 200.00 | 7500.00 | 5000.00 |
| 06 | ලූණුවත්ත පොළ භූමියේ මාළු කඩ කාමර අංක 04 | 1,15,500.00 | 200.00 | 7500.00 | 5000.00 |

**සභාපති**
**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**
**අඹගස්දෝව**
**2025.11.** 25

ආර්.එම්. දිනදාස රත්නායක
සභාපති
ප්‍රාදේශීය සභාව
ඌව පරණගම

CamScanner